ශ්‍රී ලංකාවේ බොහෝ විදේශිකයින්ව, ඔවුන්ගේ සමේ වර්ණය පදනම් කරගනිමින් "සුද්දන්" ලෙසින් හැඳින්වීම දක්නට ලැබෙනා භාවිතාවකි. කෙසේ නමුත්, "සුද්දා" යන යෙදුම හා බැඳී ඇති සමාජ ආකල්පයන්ද සැලකිල්ලට ගත් විට, එසේ සමේ වර්ණය පදනම් කරගනිමින් කරනා හැඳින්වීමක් කොන් කිරීමක් නොවන්නේදැයි අප විමසිය යුතුයි. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය ආර්ථිකයේ සැලකිය යුතු තැනක් ගන්නා රටක, පුවත්පතක මුල් පිටුවකම සිදුවන එවැනි කොන් කිරීම් කෙතරම් සෘණාත්මක බලපෑමක් ඇති කරනු ඇතිදැයි ද අප විමසිය යුතුයි.

ඒ අනුව, පහත සිරස්තල වලින්, ඔබ තෝරාගන්නේ කුමන සිරස්තලයන් ද?

1) විදේශිකයන් සමඟ ගනුදෙනු විදෙස් මුදල්වලින්ම පමණයි - දිවයින (2022-01-21)
2) විදේශිකයන් සමග රුපියල් ගනුදෙනු එපා - අරුණ (2022-01-21)
3) විදේශිකයන්ගෙන් අය කිරීම් ඩොලර්-පවුම් විතරයි - ලංකාදීප (2022-01-21)
4) සුද්දන්ට සර්විස් ඩොලර්වලට විතරයි - මව්බිම (2022-01-21)